දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி 0112698507 , 0112694033
Telephone ) 0112675449 ,0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXQ/08/2024

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2024/11/04
Date )

**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**சுகாதார அமைச்சு**
**Ministry of Health**

---

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 - 159 / 2024**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ,
අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර,
අධ්‍යක්ෂ - ජාතික රෝහල, ගාල්ල,
රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්‍ෂවරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (MN - 03 - 2006 - ඒ) දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (පළමු වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN 03 -2006 - ඒ) III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **2025.02.08 හා 2025.02.09** දිනයන්හි සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. **සුදුසුකම්.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN 03 – 2006- ඒ) III ශ්‍රේණියේ පත්වීමක් ලබා මෙතෙක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති ජායාරූප ශිල්පි (කාර්මික), විදුලි සෝපාන ශිල්පි, වායු සමීකරණ තාක්ෂණික ශිල්පි, යන්ත්‍ර පරිපාලක, ප්‍රවාහන නිලධාරි, ප්‍රවාහන වැඩමුලික, විදුලි ශිල්පි, සැළසුම් ශිල්පි, කාර්මික නිලධාරි (සිවිල්), කාර්මික නිලධාරි (විදුලි) යන තනතුරු වල නියුතු නිලධාරින්ට පමණි.

සැ:යු:- **2024.12.12 දින වන විට III ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

03. **අයදුම්පත්.**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස්කර ගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2024.12.12** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN 03 -2006 - ඒ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2025 (පළමු වාරය)"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබිම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ "9X 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකුල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ

05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයන් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පටිපාටිය

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය **ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති, මූල්‍ය ක්‍රම සහ දෙපාර්තමේන්තු රෙගුලාසි** ලෙස ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ. එම එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.

07. විෂය නිර්දේශ මාලාව

**07.1.1 ආයතන සංග්‍රහය හා කාර්ය පාටිපාටික රීති**

මෙම ප්‍රශ්න පත්‍රය පහතින් දක්වා ඇති ආයතන සංග්‍රහයේ පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ. කාලය පැය (2½). රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් (08) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| VIII | වන පරිච්ඡේදය - | අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII | වන පරිච්ඡේදය - | නිවාඩු |
| XIII | වන පරිච්ඡේදය - | දුම්රිය බලපත්‍ර |
| XIV | වන පරිච්ඡේදය - | දිවයින තුළ රාජකාරි ගමන් |
| XIX | වන පරිච්ඡේදය - | රජයේ නිවාස |
| XLVII | වන පරිච්ඡේදය - | සාමාන්‍ය හැසිරීම හා විනය |

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| III | වන පරිච්ඡේදය - | පත් කිරීම |
| IV | වන පරිච්ඡේදය - | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිය |
| V | වන පරිච්ඡේදය - | රජයේ සේවයට පත් කිරීමට නුසුදුසු තැනැත්තන් |
| VI | වන පරිච්ඡේදය - | පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි |
| VII | වන පරිච්ඡේදය - | පත් කිරීම්වලදී අනුගමනය කළයුතු පටිපාටිය |
| VIII | වන පරිච්ඡේදය - | පරිවාස කාලය. වැඩ බැලීමේ කාලය හා පත්වීම් ස්ථිර කිරීම |
| IX | වන පරිච්ඡේදය - | තනතුරක වැඩ බැලීම සඳහා හා රාජකාරි ඉටුකිරීම සඳහා කරනු ලබන පත්කිරීම් |
| X | වන පරිච්ඡේදය - | කාර්යක්ෂමතා කඩඉම් |
| XI | වන පරිච්ඡේදය - | ජ්‍යෙෂ්ඨත්වය |
| XIII | වන පරිච්ඡේදය - | රජයේ සේවයේ විශ්‍රාමලත් තැනැත්තන් නැවත සේවයේ යෙදවීම |
| XVII | වන පරිච්ඡේදය - | උසස් කිරීම්වලදී අනුගමනය කළ යුතු පටිපාටිය |
| XVIII | වන පරිච්ඡේදය - | ස්ථාන මාරු කිරීම් |
| XX | වන පරිච්ඡේදය - | උසස් කිරීම් හා මාරු තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය |

07.1.2 මූල්‍ය ක්‍රම

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (2½). රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් (08) සමන්විතය. ඉන් ඕනෑම ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

I පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මු. රෙ. 1 සිට 68 දක්වා)

III පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)

07.1.3 දෙපාර්තමේන්තු රෙගුලාසි

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සියලුම තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කටයුතු වලට අදාල කරුණු වලට අමතරව දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙත් ආදියට අදාළව හා රෝගී සත්කාර සේවාව සහ ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාලව චක්‍රලේඛ හා උපදෙස් මත සැකසේ. කාලය පැය දෙක හමාරකි (2½). රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි.

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.

**Web Path :- www.health.gov.lk ⟶ Staff Access ⟶ Administration ⟶ Examination ⟶ Circulars**

**ස.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXQ

ආදර්ශ අයදුම්පත

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN 03 -2006 - ඒ) දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (පළමු වාරය)**

**01.** (අ) i. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................

..............................................

ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

iii. මුලකුරු සමඟ නම (සිංහලෙන්) - ..............................................

..............................................

..............................................

iv. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) –

(ආ) i. තනතුර - ..............................................

ii මෙම තනතුරට අදාළ පත්වීම් දිනය හා ලිපි අංකය - ..............................................

iii දැනට ලබන වාර්ෂික වැටුප - ..............................................

iv ජාතික හැඳුනුම්පත් අංකය -

v ජංගම දුරකථන අංකය -

vi විද්‍යුත් ලිපිනය - ..............................................

**02.** ඔබ මෙවර පෙනීසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති [ ]     දෙපාර්තමේන්තු රෙගුලාසි [ ]

මුල්‍ය ක්‍රම [ ]

**03.** (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන් ..............................................

ඉංග්‍රීසියෙන් ..............................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යාංශයට [ ]     පළාත් සභාවට [ ]

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..............................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..............................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද "9×4" ප්‍රමාණයේ රු110.00ක මුද්දර ඇලවූ ලියුම් කවර 01ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..............................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන්) - ..............................................

..............................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..............................................

..............................................

**04.** විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - .............................. ..............................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ........................................................................................................

(ආ) අයදුම්පත ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද? ........................................

| මුද්දර කොටුව |
| --- |
| |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වරට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වරට නොවන බැවින් රු....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය .............................................        ............................

අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය .............................................        ............................

නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..............................................................................මහතා/මිය / මෙනෙවිය* ..........................................නිලධාරියකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වරට / ප්‍රථම වරට නොවන* බවටද, රු............ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද, / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද,* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය .............................................        ............................

ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

...................................................... මහතා / මහත්මිය / මෙනවිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN - 03 - 2006 - ඒ) III ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාශයේ / විශේෂිත ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .............................................        ............................

විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)